පුනරීක්ෂණ

1) නිවෙස් වලට සපයන විදුලි සැපයුම වන්නේ ප්‍රත්‍යාවර්ත විදුලි සැපයුමයි.

   I. ප්‍රත්‍යාවර්ත විදුලිය උපදවා ගන්නේ කෙසේද ?
   II. ප්‍රේරකයක් වෙතට ප්‍රත්‍යාවර්ත ධාරාවක් ලබා දුන් විට ධාරාව හා වෝල්ටීයතාවය පිහිටන ආකාරය ප්‍රස්තාර සටහනකින් දක්වන්න .
   III. ධාරිත්‍රක ප්‍රතිබාධනය හා ප්‍රේරක ප්‍රතිබාධනය ගණනය කළ හැකි ප්‍රකාශයන් 2 වෙන වෙනම ලියන්න .
   IV. ප්‍රතිරෝධකයක් වෙතට ප්‍රත්‍යාවර්ත විදුලිය ලබා දුන් විට ධාරාව හා වෝල්ටීයතාවය පිහිටන ආකාරය කුමක්ද ?

2) ධාරිත්‍රක වලට තාවකාලිකව විද්‍යුත් ආරෝපණ ගබඩා කර තබා ගැනීමේ හැකියාව ඇත .

   I. මෙම හැකියාව ඔප්පු කිරීම සඳහා පරීක්ෂණයක් ඉදිරිපත් කරන්න.
   II. විචල්‍ය ධාරිත්‍රක යොදා ගන්නා අවස්ථා දෙකක් සඳහන් කරන්න .
   III. පහත කේත වලින් දැක්වෙන ධාරිත්‍රක වල ධාරිතාවය Mf වලින් දක්වන්න.

   332, 153, 104, 202

3) විදුලි කටයුතු සඳහා බහුලවම පරිණාමකය භාවිත කරන උපාංගයක් වනුයේ පරිණාමකය යි.

   I. පරිණාමක යේ ප්‍රධාන කාර්යයන් දෙකක් සඳහන් කරන්න .
   II. පරිණාමක ජව හානි දෙකක් සඳහන් කරන්න.
   III. ස්වයං පරිණාමකයක විශේෂත්වය කුමක් ද?
   IV. අවකර පරිණාමක සහිත උපකරණ දෙකක් නම් කරන්න .

4) ප්‍රත්‍යාවර්ත තරංග ඍජුකරණය කිරීම සඳහා ඩයෝඩ යොදා ගනී.

   I. ඍජුකරණය කිරීමේ ප්‍රධාන ක්‍රම දෙක කුමක් ද?
   II. ඍජුකරණයට පෙර හා පසු තරංග සටහන් ඇඳ දක්වන්න .
   III. පෙරහන් පරිපථ යොදා ගනු ලබන කාර්යයක් සඳහන් කරන්න .
   IV. ඍජුකරණ පරිපථයක සෙනර් ඩයෝඩවල අවශ්‍යතාවය කුමක් ද?